# අනුරුද්ධමනාපකායික සූත්‍රය

ඒ දවස්වල භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ වැඩ සිටියේ කොසඹෑනුවර ඝෝෂිතාරාමයේ යි. එදා ආයුෂ්මත් අනුරුද්ධ මහරහතන් වහන්සේ දවල් කාලයේ දී විවේකයෙන් යුතු ව වැඩ සිටියා. එවිට මනාපකායික නම් වූ දේවතාවියෝ බොහෝ පිරිසක් ආයුෂ්මත් අනුරුද්ධයන් වහන්සේ වැඩ සිටි තැනට පැමිණියා. පැමිණ ආයුෂ්මත් අනුරුද්ධයන් වහන්සේට ආදරයෙන් වන්දනා කොට එකත්පසෙකින් සිට ගත්තා. එකත්පසෙකින් සිට ගත් ඒ දේවතාවියෝ ආයුෂ්මත් අනුරුද්ධයන් වහන්සේට මෙහෙම පැවසුවා.

"ස්වාමීනී අනුරුද්ධයන් වහන්ස, අපි තමයි මනාපකායික කියන දේවතා කොට්ඨාසය. අපි කරුණු තුනක් සම්බන්ධයෙන් අධිපතිභාවය පවත්වනවා, කරුණු තුනක් අපට අවශ්‍ය විදියට පවත්වනවා. ස්වාමීනී අනුරුද්ධයන් වහන්ස, අපි යම් කිසි වර්ණයක් ලබා ගන්නට කැමති වෙනවා ද, එම වර්ණය එකෙණෙහි ම අපිට ලැබෙනවා. අපි යම් ආකාරයේ සැපයක් ලබා ගන්නට කැමති වෙනවා ද, එම සැපය අපිට එකෙණෙහි ම ලැබෙනවා. අපි යම් ආකාරයක ස්වරයක් (ශබ්දයක්, කටහඬක්) ලබා ගන්නට කැමැති වෙනවා ද, එම ස්වරය අපිට එකෙණෙහි ම ලැබෙනවා. ස්වාමීනී අනුරුද්ධයන් වහන්ස අපි තමයි මනාපකායිකා කියන දේවතා කොට්ඨාසය. අපි මෙන්න මේ කරුණු තුන සම්බන්ධයෙන් අධිපතිභාවය පවත්වනවා. එම කරුණු අප ගේ වසඟයේ පවත්වනවා."

ඒ වෙලාවේ ආයුෂ්මත් අනුරුද්ධ මහරහතන් වහන්සේට මෙහෙම හිතුනා. " ඒකාන්තයෙන් මේ දේවතාවන් සියලු දෙනා ම නිල් පාට වෙනවා නම්, නීල වර්ණයෙන් යුතු වෙනවා නම්, නිල් පාට ඇඳුම් වලින් යුතු වෙනවා නම්, නිල් පාට අලංකාරයන් ගෙන් යුතු වෙනවා නම් හොඳ යි."

එතකොට ඒ දේවතාවියෝ ආයුෂ්මත් අනුරුද්ධ මහරහතන් වහන්සේ ගේ සිත දැන ගෙන, සියලු දෙනා ම නිල් පාට වුනා, නීල වර්ණයෙන් යුතු වුනා, නිල් පාට ඇඳුම් වලින් යුතු වුනා. නිල් පාට අලංකාරයන් ගෙන් යුතු වුනා.

ඊ ළඟට ආයුෂ්මත් අනුරුද්ධ මහරහතන් වහන්සේට මෙහෙම හිතුනා. "ඒකාන්තයෙන් මේ දේවතාවන් සියලු දෙනා ම රන්වන් වෙනවා නම්, ............................ හොඳ යි."

එතකොට ඒ දේවතාවියෝ ආයුෂ්මත් අනුරුද්ධ මහරහතන් වහන්සේ ගේ සිත දැන ගෙන, සියලු දෙනා ම රන්වන් වුනා, ....................... රන්වන් අලංකාරයන් ගෙන් යුතු වුනා.

ඊ ළඟට ආයුෂ්මත් අනුරුද්ධ මහරහතන් වහන්සේට මෙහෙම හිතුනා. "ඒකාන්තයෙන් මේ දේවතාවන් සියලු දෙනා ම රතුපාට වෙනවා නම්, ............................ හොඳ යි."

එතකොට ඒ දේවතාවියෝ ආයුෂ්මත් අනුරුද්ධ මහරහතන් වහන්සේ ගේ සිත දැන ගෙන, සියලු දෙනා ම රතුපාට වුනා, ....................... රතුපාට අලංකාරයන් ගෙන් යුතු වුනා.

ඊ ළඟට ආයුෂ්මත් අනුරුද්ධ මහරහතන් වහන්සේට මෙහෙම හිතුනා. "ඒකාන්තයෙන් මේ දේවතාවන් සියලු දෙනා ම සුදු පාට වෙනවා නම්, සුදු වර්ණයෙන් යුතු වෙනවා නම්, සුදු

පාට ඇඳුම් වලින් යුතු වෙනවා නම්, සුදු පාට අලංකාරයන් ගෙන් යුතු වෙනවා නම් හොඳ යි.”

එතකොට ඒ දේවතාවියෝ ආයුෂ්මත් අනුරුද්ධ මහරහතන් වහන්සේ ගේ සිත දැන ගෙන, සියලු දෙනා ම සුදු පාට වුනා, සුදු වර්ණයෙන් යුතු වුනා, සුදු පාට ඇඳුම් වලින් යුතු වුනා. සුදු පාට අලංකාරයන් ගෙන් යුතු වුනා.

ඊ ළඟට ඒ දේවතාවියන් අතරින් එක දේවතාවියක් ගීතයක් ගායනා කළා, එක දේවතාවියක් නැටුවා, එක දේවතාවියක් අත්වලින් තාලයට හඬ නැගුවා. ඒ ශබ්දය මේ වගේ එකක්, ඉතා හොඳින් සකස් කරන ලද, කලින් මැනවින් වාදන කරන ලද, දක්ෂ අය විසින් වාදනය කරන ලද පංචංග සමන්නාගත තූර්යනාදයක් යම් ආකාරයකට සොඳුරු යි ද, සිත අලවනසුලු ද, කන්කලු යි ද, ප්‍රේමනීය යි ද, මන්මත්කරවන සුලු ද අන්න ඒ වගේ ම ඒ අලංකාරවත් දේවතාවියන් ගේ ශබ්දය ඉතා සොඳුරු යි, සිත අලවන සුලු යි, කන්කලු යි, ප්‍රේමනීය යි, මන්මත්කරවන සුලු යි.

මෙය සිදුවන අවස්ථාවේ ආයුෂ්මත් අනුරුද්ධ මහරහතන් වහන්සේ තමන් වහන්සේ ගේ ඉඳුරන් යටට හරවා ගත්තා. (එම නැටීම හෝ ගැයීම මෙනෙහි කළේ නැහැ. ඉන් සිත ඉවත් කරගත්තා) එවිට ඒ දේවතාවියෝ "ආර්ය වූ අනුරුද්ධයන් වහන්සේ මෙයට කැමැති නැහැ” යි සිතා එතැන ම අතුරුදහන් වී ගියා.

ඉන්පසු ව ආයුෂ්මත් අනුරුද්ධ මහරහතන් වහන්සේ සවස් වරුවේ භාවනාවෙන් නැගීසිට, භාග්‍යවතුන් වහන්සේ වෙත වැඩම කළා. වැඩම කොට භාග්‍යවතුන් වහන්සේට ආදරයෙන් වන්දනා කොට එකත්පසෙකින් හිඳ ගත්තා. එක්පසෙකින් හිඳගත් ආයුෂ්මත් අනුරුද්ධ මහරහතන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය පැවසුවා.

"ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, මම අද දහවල් කාලයේ විවේකයෙන් වාසය කරමින් සිටියා. ස්වාමීනී ඒ අවස්ථාවේ මනාපකායික නම් වූ දේවතාවියෝ බොහෝ පිරිසක් මා සිටි තැනට පැමිණියා. පැමිණ මා හට වන්දනා කොට එකත්පසෙකින් සිට ගත්තා. එකත්පසෙකින් සිට ගත් ඒ දේවතාවියෝ මා හට මෙසේ පැවසුවා..

'ස්වාමීනී අනුරුද්ධයන් වහන්ස, අපි තමයි මනාපකායික කියන දේවතා කොට්ඨාසය. අපි කරුණු තුනක් සම්බන්ධයෙන් අධිපතිභාවය පවත්වනවා, කරුණු තුනක් අපට අවශ්‍ය විදියට පවත්වනවා. ස්වාමීනී අනුරුද්ධයන් වහන්ස, අපි යම් කිසි වර්ණයක් ලබා ගන්නට කැමති වෙනවා ද, එම වර්ණය එකෙණෙහි ම අපිට ලැබෙනවා. අපි යම් ආකාරයේ සැපයක් ලබා ගන්නට කැමති වෙනවා ද, එම සැපය අපිට එකෙණෙහි ම ලැබෙනවා. අපි යම් ආකාරයක ස්වරයක් (ශබ්දයක්, කටහඬක්) ලබා ගන්නට කැමැති වෙනවා ද, එම ස්වරය අපිට එකෙණෙහි ම ලැබෙනවා. ස්වාමීනී අනුරුද්ධයන් වහන්ස අපි තමයි මනාපකායිකා කියන දේවතා කොට්ඨාසය. අපි මෙන්න මේ කරුණු තුන සම්බන්ධයෙන් අධිපතිභාවය පවත්වනවා. එම කරුණු අප ගේ වසඟයේ පවත්වනවා.'

ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, ඒ වෙලාවේ මට මෙහෙම හිතුනා. 'ඒකාන්තයෙන් මේ දේවතාවන් සියලු දෙනා ම නිල් පාට වෙනවා නම්, නීල වර්ණයෙන් යුතු වෙනවා නම්, නිල් පාට ඇඳුම් වලින් යුතු වෙනවා නම්, නිල් පාට අලංකාරයන් ගෙන් යුතු වෙනවා නම් හොඳ යි.'

එතකොට ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, ඒ දේවතාවියෝ මගේ සිත දැන ගෙන, සියලු දෙනා ම නිල් පාට වුනා, නීල වර්ණයෙන් යුතු වුනා, නිල් පාට ඇඳුම් වලින් යුතු වුනා. නිල් පාට අලංකාරයන් ගෙන් යුතු වුනා.

ඊ ළඟට ස්වාමීනී මට මෙහෙම හිතුනා. 'ඒකාන්තයෙන් මේ දේවතාවන් සියලු දෙනා ම රන්වන් වෙනවා නම්, ............................. හොඳ යි.' එතකොට ස්වාමීනී, ඒ දේවතාවියෝ මගේ ගේ සිත දැන ගෙන, සියලු දෙනා ම රන්වන් වුනා, ....................... රන්වන් අලංකාරයන් ගෙන් යුතු වුනා.

ඊ ළඟට ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස මට මෙහෙම හිතුනා. 'ඒකාන්තයෙන් මේ දේවතාවන් සියලු දෙනා ම රතුපාට වෙනවා නම්, ............................. හොඳ යි.' එතකොට ස්වාමීනී, ඒ දේවතාවියෝ මගේ සිත දැන ගෙන, සියලු දෙනා ම රතුපාට වුනා, ....................... රතුපාට අලංකාරයන් ගෙන් යුතු වුනා.

ඊ ළඟට ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස මට මෙහෙම හිතුනා, 'ඒකාන්තයෙන් මේ දේවතාවන් සියලු දෙනා ම සුදු පාට වෙනවා නම්, සුදු වර්ණයෙන් යුතු වෙනවා නම්, සුදු පාට ඇඳුම් වලින් යුතු වෙනවා නම්, සුදු පාට අලංකාරයන් ගෙන් යුතු වෙනවා නම් හොඳ යි.' එතකොට ස්වාමීනී ඒ දේවතාවියෝ මගේ සිත දැන ගෙන, සියලු දෙනා ම සුදු පාට වුනා, සුදු වර්ණයෙන් යුතු වුනා, සුදු පාට ඇඳුම් වලින් යුතු වුනා. සුදු පාට අලංකාරයන් ගෙන් යුතු වුනා.

ඊ ළඟට ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, ඒ දේවතාවියන් අතරින් එක දේවතාවියක් ගීතයක් ගායනා කළා, එක් දේවතාවියක් නැටුවා, එක් දේවතාවියක් අත්වලින් තාලයට හඬ නැගුවා. ඒ ශබ්දය මේ වගේ එකක්, ඉතා හොඳින් සකස් කරන ලද, කලින් මැනවින් වාදන කරන ලද, දක්ෂ අය විසින් වාදනය කරන ලද, පංචංග සමන්නාගත තූර්යනාදයක් යම් ආකාරයකට සොඳුරු යි ද, සිත අලවනසුලු ද, කන්කලු යි ද, ප්‍රේමනීය යි ද, මන්මත්කරවන සුලු ද අන්න ඒ වගේ ම ඒ අලංකාරවත් දේවතාවියන් ගේ ශබ්දය ඉතා සොඳුරු යි, සිත අලවන සුලු යි, කන්කලු යි, ප්‍රේමනීය යි, මන්මත්කරවන සුලු යි.

ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, මම ඒ අවස්ථාවේ දී මගේ ඉඳුරන් යටට හරවා ගත්තා. (එම නැටීම හෝ ගැයීම මෙනෙහි කළේ නැහැ. ඉන් සිත ඉවත් කරගත්තා) ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, එවිට ඒ දේවතාවියෝ 'ආර්ය වූ අනුරුද්ධයන් වහන්සේ මෙයට කැමැති නැහැ' යි සිතා එතැන ම අතුරුදහන් වී ගියා. ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, කරුණු කීයකින් යුක්ත වූ ස්ත්‍රිය ද, කය බිඳී මරණයට පත් වූ පසු මනාපකායිකා දෙවියන් අතර උපදින්නේ..?"

"පින්වත් අනුරුද්ධ ධර්ම (කරුණු) අටකින් යුක්ත ස්ත්‍රිය කය බිඳී ගොස් මරණයට පත් වූ පසු මනාපකායිකා දෙවියන් අතර උපදිනවා. මොනවා ද ඒ කරුණු අටඃ

01. පින්වත් අනුරුද්ධ, මේ ලෝකයේ ස්ත්‍රියක් ව ඇය ගේ යහපත කැමති, ඇයට හිතවත් වූ, ඇයට අනුකම්පා කරන දෙමව්පියන් විසින් අනුකම්පාව උපදවාගෙන යම් කිසි ස්වාමියෙකුට සරණපාවා දෙනවා ද, ඇය එම ස්වාමියාට කලින් අවදිවෙනවා. ඔහුට පසු ව නින්දට යනවා. කුමක් ද කළ යුත්තේ යැ යි සොයා බලා කටයුතු කරනවා. ඔහුට ප්‍රියමනාප ලෙස හැසිරෙනවා. ඔහුට ප්‍රිය වචනයෙන් කථා කරනවා.

02. තම ස්වාමියා ගේ ගරුකටයුතු යම් කිසි පිරිසක් සිටිනවා ද, ඒ කියන්නේ මව හෝ වේවා, පියා හෝ වේවා ශ්‍රමණබ්‍රාහ්මණවරුන් වේවා, ඇය ඔවුනට සත්කාර කරනවා, ගරුකරනවා, බුහුමන් දක්වනවා, පූජා පවත්වනවා, ඔවුන් පැමිණිවිට අසුන් පනවනවා. පැන් පූජා කරනවා.

03. තම ස්වාමියා ගේ යම් අභ්‍යන්තර කර්මාන්ත කටයුතු තිබෙනවා ද, ඒ කියන්නේ එලුලොම් විවීම වේවා, කපු කැටීම වේවා, ඇය ඒ සියල්ලෙහි ම දක්ෂ වෙනවා, කම්මැලි වන්නේ නැහැ, උපාය වීමංශනයෙන් යුතු වෙනවා. එම කටයුතු කිරීමෙහි ත් සංවිධානය කිරීමෙහි ත් දක්ෂ වෙනවා.

04. තම ස්වාමියා යටතේ වැඩ කරන යම් පිරිසක් සිටිනවා නම්, ඒ කියන්නේ දාසයෝ වේවා, මෙහෙකරුවෝ වේවා, කම්කරුවෝ වේවා, යම් පිරිසක් සිටිනවා නම්, ඇය ඔවුන් කළ දේ කළ දේ හැටියට දැනගන්නවා. නො කළ දේ නො කළ දේ හැටියට දැන ගන්නවා. රෝගී වූ අය ගේ හැකියාවන් නො හැකියාවන් දැනගන්නවා, අනුභව කළ යුතු ආහාරපානාදිය කොටස් වශයෙන් බෙදා අවශ්‍යපරිදි ඔවුන්ට ලබා දෙනවා.

05. තමන් ගේ ස්වාමියා ගෙන එන යම් ධනයක් වේවා ධාන්‍යයක් වේවා, රන් රිදී වේවා, ඇය ඒ සියල්ල ආරක්ෂා කරනවා. ඒවාට රැකවරණය සළසනවා. ඒවාට ගිජු වන්නේ නැහැ, ඒවා සොරකම් කරන්නේ නැහැ, ඒවාට ලොල් වන්නේ ත් නැහැ, ඒවා විනාශ කරන්නේ ත් නැහැ.

06. ඇය බුදුරජාණන් වහන්සේ සරණ ගිය, ධර්මය සරණ ගිය, ආර්ය සංඝයා සරණ ගිය උපාසිකාවක් ද වෙනවා.

07. ඇය ප්‍රාණඝාතයෙන් වැළකුණු, සොරකමින් වැළකුණු, වැරදිකාමසේවනයෙන් වැළකුණු, බොරු කීමෙන් වැළකුණු, මත්පැන් මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකුණු සිල්වත් තැනැත්තියක් ද වෙනවා.

08. ඇය මසුරුමල බැහැර කළ සිතින් ගිහිගෙයි වාසය කරන ත්‍යාගවන්තියක් වෙනවා. දන්දීමට යොමු ව සිටිනවා. දන් දීම පිණිස දෑත් සොදාගෙන සිටිනවා. දන්දීමෙහි ඇලී සිටිනවා. ඇය වෙත පැමිණ යමක් ඉල්ලා සිටීමට සුදුසු ව සිටිනවා. දන් බෙදා දීමෙහි ඇලී වාසය කරනවා.
පින්වත් අනුරුද්ධ මෙම කරුණු අටෙන් යුක්ත ස්ත්‍රිය කය බිඳී මරණයට පත් වූ පසු මනාපකායිකා දෙව්වරුන් අතර උපදිනවා.

<u>ගාථා</u>

**01. යෝ නං භරති සබ්බදා නිච්චං ආතාපී උස්සුකෝ**
**තං සබ්බකාමදං පෝසං භත්තාරං නාතිමඤ්ඤති**

යම් පුරුෂයෙක් හැම කල්හි ම නිරන්තරයෙන් වෙහෙසී තමන් ගේ භාර්යාව පෝෂණය කරයි ද, ඇයට කැමති හැම දෙයක් ම ලබා දෙයි ද, (ඇය) තමන් ගේ ඒ ස්වාමිපුරුෂයා ව ඉක්මවා නො යන්නේ ය.

**02. න චාපි සොත්ථී භත්ථාරං ඉස්සාවාදේන රෝසයේ**
**භත්තු ච ගරුනෝ සබ්බේ පතිපූජේති පණ්ඩිතා**

නැණවත් වූ සුන්දර ස්ත්‍රිය තම ස්වාමියා ව ඊර්ෂ්‍යාසහගත වචන වලින් කෝප කරන්නේ නැහැ. සිය ස්වාමියා ව ගුරුතනතුරෙහි තබා පූජා සත්කාර කරනවා.

**03. උට්ඨායිකා අනලසා සංගහීතපරිජ්ජනා**
**භත්තු මනාපං චරති සම්භතං අනුරක්ඛති**

නැගී සිටි වීර්යය ඇති කම්මැලි නැති, හොඳින් සංග්‍රහ කරන ලද පිරිවර ජනයා ඇති ඇය සිය ස්වාමියා ගේ සිත් ගන්නා අයුරින් හැසිරෙනවා. ස්වාමියා ඉපයූ ධනය ආරක්ෂා කරනවා.

**04. යා ඒවං වත්තති නාරී භත්තු ඡන්දවසානුගා**
**මනාපා නාම තේ දේවා යත්ථ සා උපපජ්ජතී’ති.**

යම් ස්ත්‍රියක් මේ ආකාරයට සිය ස්වාමියා ගේ යහපත් කැමැත්තට අනුව ජීවිතය ගත කරයි නම්, ඇය මනාපකායික දෙවියන් යම් තැනක ද එතැන උපදිනවා. භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ මේ උතුම් දේශනය වදාළ සේක. මේ දේශනයට සවන් දුන් ආයුෂ්මත් අනුරුද්ධ මහරහතන් වහන්සේ ඉතා සතුටට පත් වුනා. සාදුකාර නංවමින් මේ උතුම් දේශනය සතුටින් පිළිගත්තා.

**සාදු ! සාදු !! සාදු !!!**



**DhammaMedicine**

Namo Buddhaya !!!
This is the only path; there is none other for the purification of insight !

Visit this Google Group
Click2Comment | Discussions |